# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2216/17 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 8/2003.

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත**

6ඇ වගන්තිය යටතේ වූ නියමය

2003 අංක 12 දරන පනත මගින් සංශෝධිත, 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6ඇ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු කොමසාරිස් බදුඅරඹේ කංකානම්ගේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති වන මා විසින් කම්කරු විෂය භාර අමාත්‍යවරයා විමසා, මෙම නියමය මගින්, ඉහත කී පනතේ 6ඇ වගන්තිය යටතේ සාදන ලදුව, 2005 මාර්තු මස 15 වැනි දින අංක 1384/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, එහි උපලේඛනයේ කම්කරුවකුට වන්දි මුදල් ගෙවීම පිළිබඳ සූත්‍රය දක්වා ඇති නියමය, එහි (2) වන ඡේදයේ "රුපියල් දොළොස් ලක්ෂ පනස් දහසක්" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ විසිපහක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**බදුඅරඹේ කංකානම්ගේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
**කම්කරු කොමසාරිස්.**

2021 පෙබරවාරි මස 19 වැනි දින.
කොළඹ දී ය.

03 - 267


1A - G 33801 — 30 (2021/02)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*